## සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

### 01. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධානවලට අනුව, සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

### 02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර

#### 2.1 අදාළ නිලධරයන්

රාජ්‍ය සෞඛ්‍ය සේවයට අයත් රජයේ අමාත්‍යාංශය යටතේ පාලනය වන සියළුම රෝහල් හා සෞඛ්‍ය ආයතනවල සේවය කරනු ලබන සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III, II හා I ශ්‍රේණිවල සියළුම නිලධාරීන් මෙම වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වේ.

#### 2.2. සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

2.2.1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. එසේම නව පත්වීම් ලැබූ නිලධරයෙකුනම් මුල් සේවා ස්ථානයේ වසර 03ක් වත් සේවය කර තිබීම අවශ්‍ය වේ.

2.2.2 එකම සේවා ස්ථානයක් තුල වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළු නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

#### 2.3 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු

i. වසර 05කට වැඩි සේවා කාලයක් සහිත සියලුම නිලධරයන් ඔවුන්ගේ රුචිකත්වය සළකා හෝ නොසළකා වර්තමාන සේවා ස්ථානයෙන් පිටතට මාරු කරනු ලැබේ.

ii. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතරින් වැඩි සේවා කාලයක් හෝ ඉහත 2.2.2.හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයෙකු එම සේවා ස්ථානයට මාරු කරනු ලබන අතර එකී සේවා ස්ථානයෙන්, ඉහත 2.2.2.හි අවශ්‍යතා සම්පූර්ණ කළ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියා ඉන් පිටතට මාරු කළ හැකිය.

iii. ස්ථාන මාරු කමිටුව විසින් නිලධරයන් මාරු කිරීමේදී රෝහල්/ආයතනවල සේවා අවශ්‍යතාවන්ද කාර්යාලවල කාර්ය මණ්ඩල කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට ද හැම විටම උත්සාහ කරනු ලැබේ.

iv. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවන්නේනම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව කටයුතු නොකරන නිලධාරීන්ගෙන් එසේ කටයුතු නොකිරීමට හේතු විමසමින් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

v. වාර්ෂික ස්ථානමාරු කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරු වීම් ලබාදීමේ ගැටළු පැන නැගී ඇත්නම් සමාලෝචන කමිටුව මගින් එම කරුණු සලකා බලා නව ස්ථාන මාරු ලබාදීමේ හැකියාව ඇති අතර, එවැනි නිලධාරීන් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලබන අතර විනයානුකූලව කටයුතු කිරීමට ඉඩ ඇත.

2.3.1 සේවා කාලය ගණනය කිරීම

i. වාර්ෂික ස්ථානමාරුවලදී කාල ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (උදා:- 2027 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2026.12.31 දිනය)

ii. සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කල වර්ෂයේ ජනවාරි මස පළමු දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ලට යොමු කරනු ලැබේ.

iii. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේ දී එම දිස්ත්‍රික්කය තුළ කුමන හෝ රෝහලක/ ආයතනයක සේවය කළ කාලසීමාවන් හි එකතුව දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගැනේ.

iv. ආයතනයක සේවය කළ කාලය ගණන් ගැනීමේ දී නිලධරයකුගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

2.3.2 වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් කටයුතු නොකළ යුතු අවස්ථා

සේවා කාලය වසර 5ට වැඩි නිලධරයන් ස්ථාන මාරු කිරීමේදී යම් නිලධරයෙකු තවදුරටත් රඳවා ගැනීමට එම ආයතන ප්‍රධානීන් විසින් අදාළ අවශ්‍යතාව නිශ්චිතව පැහැදිලි කිරීමක් සහිතව කරනු ලබන නිර්දේශ අවස්ථානුකූලව අනෙකුත් නිලධාරීන් හට ස්ථාන මාරු ලබා ගැනීමේ අයිතියට බාධාවක් නොවන පරිදි පමණක් සලකා බැලීමට වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් කටයුතු කරනු ලැබේ.

3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 250(III) රීතියේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2024හි සඳහන් විධිවිධාන අනුව පත් කෙරේ.

4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන් හි 254(II)හි විධිවිධාන අනුව පත් කෙරේ.

5. වාර්ෂික ස්ථානමාරු ලබා දීමේ දී සැළකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

5.1 විශේෂිත කරුණු;

i. යම් නිලධරයෙකුගේ කලත්‍රයා උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්ත්වයකට පත්ව ඇති පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ නිලධරයකු බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථානමාරුවීම් කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

ii. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

iii. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම ආයතන ප්‍රධානීයාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන ස්ථාන මාරුවීම් සම්බන්ධව සළකා බලනු ලැබේ.

iv. ආබාධිත, පුනරුත්ථාපන කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරුවීම් කරනු නොලැබේ.



no

**5.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්**

i. අවුරුදු 56 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

ii. අයදුම්පත් භාර දිය යුතු අවසාන දිනට අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුවද මාරු කරනු නොලැබේ.

**5.3 වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය**

i. කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළිගත් සෞඛ්‍ය සේවයේ සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයට අයත් වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා ජාතික සංවිධායක යන ප්‍රධාන තනතුරු 04 දරන්නන් ස්ථාන මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය.

ii. මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳීමට අපේක්ෂා කරන සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ වෘත්තීය සංගමයේ ලේකම් මඟින් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙල කර (ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයෙහි 7:5 උපවගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයෙහි 7:2 උප වගන්තිය අනුව අනුග්‍රහය ලබා දිය යුතු වන්නේ කවර නිලතල වලටද යන වගත්, අනුයුක්ත කළ යුතු වන්නේ කවර ස්ථාන වලටද යන වගත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

**06. සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ ස්ථාන මාරු කාල සටහන**

| | |
|---|---|
| ජුනි මස 15 වන දිනට පෙර | ස්ථාන මාරු කමිටුව පිහිටුවීම |
| ජුනි මස 30 වන දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරිම |
| ජුලි 31 වන දිනට පෙර | පහත සඳහන් ලේඛන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කිරීම<br>i. ස්ථාන මාරු අයදුම්කළ නිලධාරීන්ගේ නාම ලේඛනය<br>ii. අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ කරනු ලදුව හා නිල මුද්‍රාව සහිතව අත්සන් කරන ලද එම නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්<br>iii. පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රෝහල්/ආයතනය තුළ වසර 05ට වඩා සේවය කළ නිලධාරීන්ගේ නාම ලේඛනය |
| අගෝස්තු මස 10 වන දිනට පෙර | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත භාර දීම |

| | |
|---|---|
| අගෝස්තු මස 31 වන දිනට පෙර | ස්ථාන මාරු කමිටුව විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ස්ථාන මාරු යෝජනා ඉදිරිපත් කිරීම |
| සැප්තැම්බර් මස 15 වන දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුව පත් කිරීම |
| සැප්තැම්බර් මස 30 වන දිනට පෙර | ස්ථාන මාරුවීම් පිළිබඳ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීම |
| ඔක්තෝම්බර් මස15 වන දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ ලබා දීම |
| නොවැම්බර් මස 01 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම |
| නොවැම්බර් මස 15 දිනට පෙර | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අවසන් දිනය |
| ජනවාරි මස 01 දින සිට | වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම |

**07. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම.**

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේනම්, එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 16 පරිශිෂ්ටය අනුව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි ආයතන ප්‍රධානියා හා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත්වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකිය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයකු භාර දෙනු ලබන අභියාචනයට අදාළ සියලු ලිපිගොනු, ලිපිලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15 ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වග බලා ගත යුතු වන්නේය. එතකදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපි ගොනු, ලිපිලේඛන, වාර්තා, නිරීක්ෂණ හා පරිශිෂ්ට 16 හා 17 ද



nd

සමඟ නිර්දේශ සහිත එම අභියාචනය නොවැම්බර් මස 15 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සළකා බලනු නොලබන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, අදාළ ලිපිගොනු යථාවත් කර ගැනීම සඳහා එහි පිටපත් ආයතන ප්‍රධානියා හා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේ වුවද ඒ සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ අවසන් තීරණය ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

| සකස් කළේ: | පරීක්ෂා කළේ: |
|---|---|
| අත්සන : .................... | අත්සන : .................... |
| (විෂයභාර මාණ්ඩලික නිලධාරියා) | (විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) |
| නම : සී.එම්.එන්. දිසානායක | නම : ඊ.එච්.ටී.සී. ප්‍රියංකාන්ති |
| තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI | තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I |
| දිනය : 2026-08-26 | දිනය : 2026.08.26 (වෙනුවට) |

සී.එම්.එන්. දිසානායක
අධ්‍යක්ෂ (පාලන) VI
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය
කොළඹ - 10.

ඊ.එච්.ටී.සී. සුරේඛා ප්‍රියකාන්ති
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය" කොළඹ 10.

08.

යොමු අංකය: 06/C/PHMA/ආ.ස්.මා/2027

~~2026.08.18~~ 2021.10.14 ............... දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයන් සඳහා වන ස්ථාන මාරු පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන: ..........................................

නම: විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය: 2026/08/30 නිල මුද්‍රාව: ..........................................

යොමු අංකය: PSC/EST/06-04/02/2021

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, සෞඛ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයන් සඳහා යෝජිත මෙම ස්ථාන මාරු පටිපාටිය 2021.10.14 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන: ..........................................

නම: ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න.

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

දිනය: 2026/9/7 නිල මුද්‍රාව: ..........................................